# අගනුවර වතු ජනතාවට සැනසුම ගෙනෙන පුර නැඟුම

අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය සමාන්තර ආයතන හා එක්ව කොළඹ නාගරික වතු ජනාවාස ආශ්‍රිත ජනතාව වෙනුවෙන් ''පුර නැගුම'' නමින් නව වැඩසටහනක් ක්‍රියාත්මක කරයි. මේ ලිපිය ඒ නිමිත්තෙනි.

බන්ධනාගාරය සුන්දර තැනක් නොවේ. එහි කාමර අඳුරුය. වාතාශ්‍රයක් නැත. එහි වෙසෙන්නන් ගත කරන්නේ දුඃඛිත ජීවිත ය. එහෙත් මේ පිරිස සමාජය නොඉවසන අපරාධවලට වගකිව යුත්තන්ය.

2008 වසර අවසන් වන විට විවිධ අපරාධවලට සම්බන්ධව බන්ධනාගාරගතව සිටි පුද්ගලයන් 33,000 ක පමණ පිරිසක් අතුරින් හරි අඩක් එනම් 15,000 ක් පමණ කොළඹ නාගරික ප්‍රදේශ ආශ්‍රිත පදිංචිකරුවන් බව අනාවරණය වී තිබේ. අගනුවරින් බැහැර ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ චෝදනාව වී ඇත්තේ සියලු සම්පත් හිමිව ඇත්තේ කොළඹට පමණක් බවය. අවසානයේ බන්ධනාගාර පිරී ඇත්තේ කොළඹ වෙසෙන නාගරික දිළිඳු ජනතාවගෙන්ම බව ප්‍රකාශ වීම කෙතරම් ඛේදවාචකයක්ද?

මෙම ස්වභාවය තුරන්කර මෙම පිරිස නීතිගරුක සහජීවනයෙන් යුත් පුරවැසියන් බවට පත්කිරීම අරමුණු කරගෙන එම ප්‍රදේශවල යටිතල පහසුකම් නංවා සමාජ ආර්ථික අවශ්‍යතා වැඩි දියුණු කරන විශේෂ ව්‍යාපෘතියක් අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් ''පුර නැගුම'' නමින් 2010 නව වසරේ සිට ක්‍රියාවට නංවනු ඇත. පුර නැගුමෙන් සිදුවන්නේ බන්ධනාගාරයට සිරවන ජීවිත එයින් මුදා යහපත් පුරවැසියන් කිරීමයි. වැරදි කරන මිනිසුන්ට නීතියට අනුව දඬුවම් පැමිණවීමේ වගකීමක් තිබේ. එහෙත් එයට සමාන්තරව මෙම වරදකරුවන් යළි බන්ධනාගාර ගත නොවන පසුබිමක් නිර්මාණය කිරීමේ යුතුකමද අමතක නොකළ යුතුය.

අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතා තම අමාත්‍යාංශයේ නිශ්චිත කාර්ය භාරයට අමතරව අමාත්‍යාංශය හා පොදු ජනතාව අතර මනා සබඳතාවක් ගොඩනංවා මහජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම පිණිස ගතවූ කාලය ඇතුළත ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාවට නැංවූ අතර පුර නැගුම එහි තවත් පියවරකි.

ඒ මහතා අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා වශයෙන් පත්වීම සමග අමාත්‍යාංශය නව ප්‍රවේශයකට යොමු කැරිණි. ඇප මුදල් ගෙවා ගත නොහැකිව සිටි අහිංසක සුළු වැරදිකරුවන් නිදහස් කිරීම, සිරගතව සිටි හමුදාවෙන් පැන ගිය සෙබළුන්ට ආරක්ෂක අමාත්‍යාංශය හා එක්ව කළ සාකච්ඡාවකින් අනතුරුව රජයේ පොදු සමාවක් ලබාදීම හා විනිසුරුවන් නොවන එහෙත් අධිකරණ නිලධාරීන්ගෙන් සිදුවන දුර්වලතා මගහැරීමට ඒකකයක් හා මහජනතාවට කෙළින්ම අමාත්‍යාංශයට අදාළ පැමිණිලි වෙතොත් දැනුම්දී යුක්තිය ඉටු කරගැනීම උදෙසා මහජන සාධාරණ ඒකකයක් ද ස්ථාපිත කරන ලද අතර මෙම පුර නැගුම වැඩසටහන එහි තවත් පියවරකි.

අලුත් දශයකට ශ්‍රී ලංකාව ප්‍රවේශ වන අවස්ථාවේ දී අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය කොළඹ නාගරික වතු ජනාවාස ආශ්‍රිත ජනතාව වෙනුවෙන් පුර නැගුම වැඩ සටහන ආරම්භ කරන අතර එයට සහය දක්වන්නට කොළඹ මහ නගර සභාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, පරිසර අමාත්‍යාංශය, බස්නාහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය, පහත්බිම් සංවර්ධන මණ්ඩලය, රීල් ආයතනය, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය එක්ව සිටී.

වතු ආශ්‍රිත නාගරික ජනගහණයෙන් වැඩි පිරිසක් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවීම, නිසි ආදායම් මාර්ගයක් නැති වීම, සාරධර්ම වලින් පිරිහීම, පවත්නා නීති ගැන අවබෝධයෙන් තොර වීම, අපරාධයක් කළ විට ලැබෙන දඬුවම ගැන නොදැනුවත්කම, නිසි නින්දක් ලද නොහැකි අඩු පහසුකම් සහිත පැල්පත්වල දිවි ගෙවීම නිසා අසහනය හා ක්‍රෝධයෙන් පසුවීම, ජල හා වැසිකිළි පහසුකම් ප්‍රමාණවත්ව නොමැතිකම නිසා අසල්වාසීන් සමග නිතර අඬ දබර කර ගැනීම. ක්‍රීඩා පහසුකම් නොමැතිවීමෙන් කුඩා දරුවන් නොමගට යොමු වීම, දරිද්‍රතාව, මන්ද පෝෂණය, අයහපත් වටපිටාව නිසා නිතර බෝවෙන රෝගවලට ගොදුරුවී අසහනකාරී ජීවිතයක් ගත කිරීම වැනි පොදු කාරණා වලින් පීඩා විඳින බව සමීක්ෂණ වාර්තාව පෙන්වාදී තිබේ.

කොළඹ නාගරිකය තුළ වතු ආශ්‍රිතව ජනාවාස සහ මහල් නිවාස සංකීර්ණ සංඛ්‍යාව 1503 කි. එහි නිවාස ඒකක 62,970 ක් ඇති අතර 3,14,850 ක ජනගහනයක් එහි වෙසෙති. මෙම ජනාවාසවල භූමියෙහි නීත්‍යානුකූල අයිතිය කොළඹ මහ නගර සභාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩලය, නාගරික සංවර්ධන අධිකාරිය, දුම්රිය දෙපාර්තමේන්තුව හා වරාය අධිකාරියට හිමි බව සඳහන්ය. එහෙත් මෙම වතු ආශ්‍රිත ජනාවාස සහ මහල් නිවාසවල අධික තදබදයක් තිබේ. මෙයට ඇතුළත් නොවන අනවසර ඉදිකිරීම් සේ සැලකෙන කුඩා පැල්පත් සංඛ්‍යාව අතිවිශාලය.




මේවායේ වෙසෙන්නන් ගේ ප්‍රශ්න විවිධාකාරය. ඔවුන්ට ස්වකීය මහන්සියෙන් තම ගැටලුවලට මුහුණ දෙන්නට ඉඩක් නැති නිවාස, අධ්‍යාපනය, බෙහෙත් හේත් ඇතුළු සියල්ල වෙනුවෙන් ලැබෙන අඩු ආදායම ප්‍රමාණවත් නැත. රැකියා හිඟය බරපතළ ප්‍රශ්නයකි. මේ නිසා ඔවුහු නිරායාසයෙන්ම ලෙහෙසියෙන් මුදල් උපයා ගත හැකි වැරදිවලට පෙළඹෙති. ප්‍රශ්න අමතක කරන්නට මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වෙති.

පුර නැගුම සංවර්ධන සැලැස්ම වෙනුවෙන් අවම වශයෙන් රුපියල් මිලියන සියයක මුදලක් අවශ්‍ය වෙතැයි ගණන් බලා තිබේ. මෙයින් සියයට විසිපහක් කොළඹ මහ නගර සභාවේ ප්‍රතිපාදන මගින් ද ඉතිරිය රජයේ අරමුදල්වලින් ද වැය කිරීමට සැලසුම් කර ඇත.

ගාමිණී සරත් ගොඩකන්ද